# පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමය යනු කුමක්ද

**පෙර ආත්ම ප්‍රතිකාර නූතන වර්තමානයේ ලෝකයේ දියුණු රටවල ඉතා ජනප්‍රිය ප්‍රතිකාර ක්‍රමයක් බවට පත්ව ඇත. පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමය හෙවත් Past Life The rapy යන්නෙන් අදහස් වන්නේ වර්තමාන ආත්මභාවය තුළ දී යම් කෙනෙකුට විඳවීමට සිදු වී යම් යම් දුෂ්කරතාවන්ට හේතු වූ කරුණු මොනවාද ? ඊට මුල් වූ කර්ම ශක්තිය කුමන ක්‍රියාවන් නිසා ආරම්භ වූයේ ද යන්න සොයා එම වැරදි ක්‍රියාව මැනවින් අවබෝධ කර ගෙන මින් ඉදිරියට එවැනි වැරදි ක්‍රියාවන්හි නොයෙදීමට දැඩි ලෙස අදිටන් කර ගැනීමයි. මේ අතර ප්‍රතිකාර ක්‍රමයක් මගින් වර්තමාන නිදහසත්, සුවයත් ලබා ගැනීමයි.**

අතුල මංචනායක




පෙර ආත්ම ක්‍රමය යම් පුද්ගලයකු හට කායිකව මානසිකව චිත්තවේගීය හා ආත්මීය වශයෙන් බල-පාන බව අධිමානසික විද්‍යාඥයෝ විශ්වාස කරති. පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමයේ දී අදාළ පුද්ගලයාගේ මතක ධාරාව ඔහුගේ හෝ ඇයගේ උත්පත්තිය දක්-වාත් පමණක් නොව ඉන් ඔබ්බටද ගොස් පෙර අත්-ධභාවයත් දක්වා ගෙන යනු ලැබේ. වර්තමාන ආත්-මභාවය තුළ හිඳිමින් පෙර ආත්මභාවයක දී බව සිදු වූ යම් ක්‍රියාවක් හෝ අවස්ථාවටත් ඒ අයුරින්ම නැවත නිරූපණය කිරීම ඔබ ලවාම සිදු කරවීමට පෙර ආත්ම ප්‍රතිකාර කරන්නා සමත් වෙයි. එමගින් එම ක්‍රියාවේ බරපතල භාවය පිළිබඳ සංඥවක් ඔබගේ යටිසිත හෙවත් උපවිඥන තුළ ඇති කිරීම මෙහි දී සිදුවේ. එම අවබෝධය තුළින් වත්මන් ජීවි-තයේ විඳින්නා වූ දුක් වේදනාවන් කෙරෙන් නිදහස් වීම සිදු වේ.

පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමයට පදනම වන්නේ හේතුව සහ ඵලය පිළිබඳ මූලධර්මයයි. වෙනත් වචනවලින් කියතොත් කර්මය පිළිබඳ සිද්ධාන්-තයයි. ඔබ විසින් පෙර ආත්මභාවයකදී කරන ලද්ද වූ යම් ක්‍රියාවන් නිසා හටගන්නා වූ ප්‍රතිවිපාකය

වත්මන් ආත්මභාවය තුළ දී කායික, මානසික,චිත්තවේගීව හෝ ආත්මීය වශයෙන් යම් පීඩාදායක විඳවීමක් ලෙසින් එළිදැක්වීම මෙහි දී සිදු වී ඇති බව පිළිගැනීමට අපට සිදු වේ. මෙහි දී අප විසින් ඉතා පැහැදිලිව තේරුම් ගත යුතු වැදගත්ම මූලධර්මය වන්නේ වත්මනෙහි අපට විඳීමට සිදු වී ඇති සියලුම දුක් වේදනා, අවස්ථා සිදුවීම් ආදි සියලු දේ අපගේම ක්‍රියාවන් නිසා හටගන්නා වූ එකක් බවයි. එනම් ඒ සියලු තත්ත්වයන්ට වගකීම අප විසින්ම භාරගත යුතු බවයි.

පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමයේ දී වර්තමාන දුක්ඛදායක තත්ත්වයන්ට හේතු වූ කරුණු සොයා ගැනීම සඳහා මෝහනය මගින් පෙර ආත්ම කරා ගෙනයාම හෙවත් මෝහන ප්‍රතිභවනය වැඩි වශයෙන් භාවිතා කරනු ලැබේ. ඒ හැරුණු විට ස්වයං මෝහන නිද්‍රාව භාවනාව මගින් අතීතානුස්මෘතිය යන ශිල්පීය ක්‍රම ද මෙහි දී ප්‍රයෝජනයට ගත හැකිය. මේ සියලු ක්‍රියා මගින් විඥානතලයේ වෙනසක් ඇති කිරීම අපේක්ෂා කෙරේ. මේ සියලු උපක්‍රම මගින් සිදු කෙරෙන්නේ කාලය ඔස්සේ ආපස්සට යෑමයි. ඒ අනුව වත්මන් ඵලවිපාකයට මුල් වූ හේතුකාරක සිද්ධිය කරා ආපසු යෑමකි.

## විඥානතලයේ මට්ටම්

අපගේ විඥානතලයේ මට්ටම් කිහිපයක් ඇති බැව් අධිමානසික විද්‍යාඥයෝ විශ්වාස කරති. ඒවායේ ඇතැම් මට්ටම් තුළ ද විශ්ව විඥානතලය සමග සම්බන්ධ වීමට ද හැකි වේ. එදිනෙද ජීවිතයේ දී පියවි සිහිනයක් හෙවත් අවදියෙන් සිටින අවස්ථාවේ දී අප වෙත පවතින විඥාන මට්ටම සරලව හෙවත් අපගේ සිත වැඩි වශයෙන් පවතින්නා වූ මට්ටම ලෙස සැලකිය හැකිය. ඊට අමතරව තින්දේදී අප විසින් එළඹෙන්නා වූ විඥාන මට්ටම් කිහිපයක්ද ඇත. ගැඹුරු නින්දේදි එක් මට්ටමකද, සරල නින්දේදී තවත් මට්ටමකද අපගේ විඥානය එළඹෙන බව අප විසින් අවබෝධ කර ගත යුතු වේ. මේ හැර භාවනාවක යෙදීමේ දී හෝ මෝහන ප්‍රතිගමන හෙවත් ක්‍රියාවලියකට සුවිශේෂ මට්ටම්වලට එළඹීමට අපට හැකි වන්නේය. අපගේ උපවිඥානයේ සැඟ වී ඇති තැන්පත් වී ඇති මතිමතාන්තර හෝ දැනුම් හෝ විවිධ තත්ත්වයන් මගින් අප නොදැනුවත්ව අපගේ එදිනෙද ජීවිතයේ පියවි තත්ත්වයන් වෙතද යම් යම් බලපෑම් ඇති කරන බව මනෝවිද්‍යාඥයන්ගේ පිළිගැනීම වේ.

## අතීතය කරා ගෙන යාම

යම් පුද්ගලයකුට තවත් කෙනෙකුව ඒ අයගේ අතීත ආත්මභාවවලදී සිදු වූ සිදුවීම් කරා ගෙන යා හැකි වේද ? තමන්ට පිළිතුර වන්නේ "ඔව්" යන්නය. අධිමානසික විද්‍යාඥ සතුට, මෝහන විද්‍යාඥයකුට හෝ ජෙනතිෂඥයකුට එසේ කළ හැකි වේ. මේ සම්බන්ධව ජූඩි හෝල් නමැති අධිමානසික විද්‍යාඥවරිය කරුණු පැහැදිලි කරන්නේ මෙසේය.

"මම ජ්‍යොතිෂය සහ වෙනත් උපක්‍රමයන් භාවිතා කරමින් මා කරා එන පුද්ගලයන්ගේ අතීත කර්ම කියවීම් ඉදිරිපත් කරමි. මෙම ක්‍රියාවලිය මුලින්ම ආරම්භ කළ අවස්ථාවේ දී මා දෑස් වසා ගන්නවාත් සමගම මා ඉදිරියේ සිටින පුද්ගලයා සම්බන්ධ අතීත ආත්මභාව සටහන් චිත්‍රපටියක් සේ මගේ දෑස් ඉදිරියේ දිග හැරීමට පටන් ගැනිණි. එය බොහෝ දුරට චිත්තරූප හෙවත් සිතුවම් ස්වරූපයෙන් සිදු විය. මා යම් කිසිවකුගේ මුහුණ දෙස බැලූ විට ඒ මුහුණ තුළින්ම ඔහුගේ හෝ ඇයගේ පෙර ආත්මභාවයක මුහුණ මැවී පෙනීමට පටන් ගැනේ. එහෙත් දැන් දැන් මා ප්‍රතිකාර කරන්නේ මා අභිමුඛයේ සිටින්නන්ට නොව මා අනභිමුඛයේ සිටින්නන්ටය" ඇය විසින් ඉහත දැක්වූ විස්තරය ඉදිරිපත් කර ඇත්තේ පෙර ආත්ම ප්‍රතිකාරය හෙවත්Pastlife Memory නමින් 1999 දී ඉන්දියාවේ දී ප්‍රකාශයට පත් කරනු ලැබූ ග්‍රන්ථයකය.

පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමය වැඩිම වශයෙන් ප්‍රයෝජනයට ගනු ලැබූ පුද්ගලයා වශයෙන් ප්‍රසිද්ධියට පත්ව සිටින්නේ ඇමෙරිකා එක්සත් ජනපදයේ වර්ජීනියා වෙරළේ විසූ එඩ්ගා කේසිය. 15000 කට වඩා වැඩි පිරිසක් සඳහා පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමය යටතේ "ජීවිත කියවීම්" ඉදිරිපත් කිරීමට හේ සමත් විය.එඩ්ගා කේසි ඉදිරිපිටට පැමිණි පුද්ගලයන් සඳහා තමන්ට තවත් අභිමුඛයට නොපැමිණි පුද්ගලයන් සඳහා ද පෙර ආත්ම ජීවිත කියවීම් ඉදිරිපත් කියවීමට එඩ්ගා කේසි සමත් වූයේය.එඩ්ගා කේසි මේ අන්දමට අනුන් සඳහා ජීවිත කියැවීම් ඉදිරිපත් කළේ ස්වයං මෝහන නිද්‍රාවට පිවිසීමෙනි. ඒ අන්දමට ස්වයං මෝහන නිද්‍රාවක් තුළදී බාහිර පුද්ගලයන්ගේ අතීත ජීවිතවලට එබී බලමින් ඔවුන්ගේ පෙර ආත්මභාවය වලදී ඔවුන් අතින් සිදු වූ වැරදි ක්‍රියා නිරාවරණය කිරීමට නේසි සමත් වූයේය. එම වැරදි වලින් නිදහස් වීම සඳහා වත්මන් ආත්මභාවය තුළ දී ක්‍රියා කළ යුතු ආකාරය ද කේසි පෙන්වා දුන්නේය. කේසි විසින් තමාගේම ආත්මභාවයන් පිළිබඳ තොරතුරු ද අනාවරණය කර තිබේ. ඔහු විසින්ම සඳහන් කර ඇති අන්දමට එක් ආත්මභාවයකදි එඩ්ගා කේසි ග්‍රීක ජාතික ශ්‍රේෂ්ඨ ගණිතඥයකු හා දර්ශනිකයකු වූ 'පයිතගරස්' ලෙසට උපත ලබා ඇත. ඊට අමතරව වෙනත් අධ්‍යාත්මික ගුරුවරුන් ලෙස ද තමා වරින්වර උපත ලබා ඇති බව ඔහු විසින් සඳහන් කර තිබේ. තමාගේ එක් පෙර ආත්මභාවයක දි පුරාණ ඊජිප්තුවේ ආශ්‍රමයක නායක පූජකවරයා ලෙස ගත කරමින් සිටිය දි තමා අතින් සිදු වූ එක්තරා වැරදි ක්‍රියාවකට වන්දි වශයෙන් තමාට මේ අන්දමින් අනුන්ගේ පෙර ආත්මභාව අනාවරණය කරමින් සේවයක් කිරීමට සිදු වූ බව ද ඔහු විසින් සඳහන් කර තිබේ.

එඩ්ගා කේසි හැරුණු විට ක්‍රිස්මින් හාට්ලි ද පෙර ආත්ම කරා එළඹීමේ හැකියාව තිබූ අභිඥයකු ලෙස හඳුන්වා දිය හැකිය. ඇයට එම හැකියාව උපතින්ම ලැබී ඇති බව සඳහන් වේ. ඇයගේ දෙමව්පියන් වික්ටෝරියානු යුගයේ එංගලන්තයේ ජීවත් ව සිටි අයවලුන් ලෙස සඳහන්ව තිබේ. තමා අවට තිබෙන්නාවූ ලෝකය පිළිබඳ අවදිබවින් යුක්තව සිටින අතරතුරේම එක්වර යම් කිසි විඥාන මට්ටමකට එළඹී පියවි සිහියෙන් බැහැර වී ස්වයං මෝහන නිද්‍රාවකට එළඹීමට ඇය සමත් වූවාය. එසේ එළඹීමෙන් පසු 'ආකාශික් වාර්තා' ස්පර්ශ කරමින් ඒවා උපයෝගී කර ගනිමින් "ජීවිත කියවීම්" ඉදිරිපත් කිරීම ඇය අතින් සිදු වේ. ආකාශික් වාර්තා යනු මෙලොව මේ දක්වා සිදු වී ඇති සියලුම සිදුවීම් සටහන්ව ඇතැයි විශ්වාස කරන වාර්තා සමූහයක් ලෙස අධිමානසික විද්‍යාඥයෝ විශ්වාස කරති. සිත දියුණු කළ මුනිවරයන්ට අභිඥයන්ට තවම ආකාශික් වාර්තාවන් වෙත එළඹී ඒවා දිග හරිමින් අතීත සිදුවීම් විස්තර කළ හැකි බැව් සඳහන් වේ. ක්‍රිස්ටින් හාට්ලි විසින් ඉදිරිපත් කරන ලද බොහෝ ජීවිත කියැවීම් මගින් සිදු කර ඇත්තේ වත්මන් ජීවිතයේ ඇති දුෂ්කරතාවන්ට මුල් වූ අතීත සිදුවීම් විස්තර කිරීමයි. වත්මන් ජීවිතයේ දක්නට ඇති ආගන්තුක බිය ජනක අවස්ථා බොහොමයකට මුල් වූ හේතු විස්තර කිරීම ඇය අතින් සිදු වී තිබේ.

> **පෙර ආත්ම ප්‍රතිකාර ක්‍රමයේ දී වර්තමාන දුක්ඛදායක තත්ත්වයන්ට හේතු වූ කරුණු සොයා ගැනීම සඳහා මෝහනය මගින් පෙර ආත්ම කරා ගෙනයාම හෙවත් මෝහන ප්‍රතිභවනය වැඩි වශයෙන් භාවිතා කරනු ලැබේ. ඒ හැරුණු විට ස්වයං මෝහන නිද්‍රාව භාවනාව මගින් අතීතානුස්මෘතිය යන ශිල්පීය ක්‍රම ද මෙහි දී ප්‍රයෝජනයට ගත හැකිය.**

වර්තමානයේ ජීවත්වන ශ්‍රේෂ්ඨ අධිමානසික විද්‍යාඥයකු ලෙස හැඳින්විය හැකි රොජර් වූල්ගර් ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ බ්‍රිතාන්‍යයේ දැනට සිටින්නා වූ පෙර ආත්ම ප්‍රතිකාර කරන්නන් අතර ප්‍රමුඛතාවය ලෙස සැලකේ. කාර්ල් යුංගේ ගුරු කුලයේ අනුගාමියකු ලෙස සැලකිය හැකි වූල්ගර් ස්විට්සර්ලන්තයේ සූරිච් නුවර දී මේ සම්බන්ධ පුහුණුව ලැබීය.මහා බ්‍රිතාන්‍යයේ ඔක්ස්පර්ඩ් සරසවියේ දී මනෝවිද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධිය ලබාගත් ඔහු පසුව පෙර ආත්ම චිකිත්සාව පිළිබඳ පර්යේෂණ ගණනාවක නියැලුණේය. පසුව ඇමෙරිකා එක්සත් ජනපදයට ගිය ඔහු පෙර ආත්ම ගවේෂකයකු ලෙස ප්‍රතිකාර කිරීම ඇරඹුවේය. තමා වෙත ආ දහස් ගණනක් දෙනා මෝහන ප්‍රතිභවන ක්‍රියාවලිය ඔස්සේ පෙර ආත්ම කරා ගෙන ගොස් ප්‍රතිකාර කිරීමට රොජර් වූල්ගාර් මේ වන විට සමත්ව සිටී. පෙර ආත්ම ප්‍රතිකාර වලදි සුව වීම සිදුවන්නේ උපවිඥානයේ සැඟවී ඇති තරක් වූ හෙවත් පිළුණු වූ මතක සටහන් ඉවත් කළ විට ඉබේටම මෙන් සුවය ලැබෙන බව රොජර් වූල්ගර් පවසන්නේ දැඩි විශ්වාසයෙන් යුතුවය. ❑